- 1658 දී පමණ මර්ෂලින් ද බොකුවර් ගේ ලිවිසුමට අනුව දෙවන රාජසිංහ රජ දවස ලන්දේසි ආගමනය විය
- අධිරාජ්‍යවාදී ආකල්ප එලෙසින්ම පැවති ඔවුන් පෘතුගීසීන්ට එරෙහිව ක්‍රියා කළ නමුත් තමන්ගේ අරමුණු වෙනුවෙන් ක්‍රියාත්මකවීමේදී ආක්‍රමණ ශිලී පිළිවෙතම අනුගමනය කළේය
- කතෝලික පූජකයින්ට හා බැතිමතුන්ට පහරදීම
- රෙපරමාදු ක්‍රිස්තියානි ආගමට පිරිස හරවා ගැනීම හා ඔවුන්ට වරප්‍රසාද අධ්‍යාපන හා වෘත්තීය වරප්‍රසාද ලබාදීම
- ඉහළ මධ්‍යම පාන්තික පිරිසක් බිහි කිරීමට හා ඔවුන්ගේ ආගමික ආර්ථික හා දේශපාලනික අවශ්‍යතා වෙනුවෙන් සුදුසු පිරිසක් බිහි කිරීමටයි
- එතෙක් මෙරට සම්මත නීති පද්ධතියක් නොපැවැති බැවින් රෝම ලන්දේසි නීතිය හඳුන්වාදීම ජනවර්ග අයිතිවාසිකම් සලකාගෙන තේසවලාමේ නීතිය සම්මත කිරීම

- 1822 දී ලන්දේසීන් සතුව පැවති වෙරළ බඩ අයිතිය ඉංග්‍රීසීන් විසින් ලබාගත්තේය. 1815 වන විට උඩරට ඇතුළු සමස්ත රාජ්‍යය ආක්‍රමණය කිරීමට ඔවුනට හැකිවිය.
- තමන්ගේ පාලන කටයුතු කරගෙන යාමට අවශ්‍ය උගතුන් බිහි කිරීම
- ක්‍රිස්තියානි නිකායන්ට අදාළ ආගම මෙරට තහවුරු කිරීම
- අධ්‍යපනය හා සංස්කෘතිය සපුරාම දේශීයත්වය හෝ සංස්කෘතිය ඉක්මවා යන සීමාවක රෝපණය කිරීම
- රාජාණ්ඩු ක්‍රමය අහෝසි කොට බ්‍රිතාන්‍ය යටත් විජිතයක් බවට පත් කිරීම
- ආර්ථික හා පරිපාලනමය ක්‍රියාවලිය සපුරාම ඉංග්‍රීසීන්ගේ අවශ්‍යතාව අනුව සකස් කොට මෙරට පැවති දේශීය අනන්‍යතාව සපුරාම පසෙක දැමීම
- නූතන ලොකයට ගැලපෙන අධ්‍යපන ආර්තික නීති හා දේශපාලන ක්‍රමයක් සඳහා වන පසුබිම විවරවීම

# ජනතාව, රජය සහ පරමාධිපත්‍යය

1. ශ්‍රී ලංකාව නිදහස්, ස්වෛරී, ස්වාධීන, ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයකි. ශ්‍රී ලංකාව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය යනුවෙන් හඳුන්වනු ලැබේ.
2. ශ්‍රී ලංකා ජනරජය ඒකීය රජයකි.
3. ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිපතය ජනතාව කෙරෙහි පිහිටා ඇත්තේ ය. පරමාධිපත්‍යය අත්හළ නොහැක්කේ ය. පරමාධිපත්‍යයට පාලන බලතල, මූලික අයිතිවාසිකම් සහ ඡන්ද බලය ද ඇතුළත් වන්නේ ය.
4. ජනතාවගේ පරමාධිපත්‍යය ක්‍රියාත්මක වීම ද, භුක්ති විඳීම ද,

## බුද්ධාගම හා මූලික අයිතිවාසිකම්

9. ශ්‍රී ලංකා ජනරජය බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේ ය. එහෙයින් 10 වැනි ව්‍යවස්ථාවෙන් සහ 14 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනු ව්‍යවස්ථාවේ (ඉ) ඡේදයෙන් සියලු ම ආගම්වලට පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂා කර දෙන අතර බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම විය යුත්තේ ය.

10. සෑම තැනැත්තකුට ම තමන් අභිමත ආගමක් ඇදහීමේ හෝ වැළඳ ගැනීමේ නිදහස ද, ලබ්ධියක් හෝ විශ්වාසයක් දැරීමේ හෝ පිළිගැනීමේ නිදහස ද ඇතුළුව සිතීමේ නිදහසට, හෘදය සාක්ෂියේ නිදහසට සහ ආගමික නිදහසට හිමිකම් ඇත්තේය.

11. කිසිම තැනැත්තකු වධ හිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේ ය.

12. (1) නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද, නීතියේ රැකවරණය ද, සර්ව සාධාරණ විය යුත්තේ යි

(2) කිසිම පුරවැසියක වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත හෝ වෙනස්කමකට හෝ විශේෂයකට හෝ භාජන නොවිය යුත්තේ ය;

## 14. (1) සෑම පුරවැසියකුට ම -

(අ) භාෂණයේ නිදහසට සහ ප්‍රකාශනය ඇතුළු අදහස් පළ කිරීමේ නිදහසට;

(ආ) සාමකාමීව රැස්වීමේ නිදහසට;

(ඇ) සමාගමයේ නිදහසට;

(ඈ) වෘත්තීය සමිති පිහිටුවීමේ සහ වෘත්තීය සමිතිවලට බැඳීමේ නිදහසට;

(ඉ) එකලාව හෝ අන් අය හා සමඟ ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව තම ආගම, ලබ්ධිය හෝ විශ්වාසය ඇදහීමෙන්, පිළිපැදීමෙන්, ප්‍රගුණ කිරීමෙන් සහඉගැන්වීමෙන් ප්‍රකාශ කිරීමේ නිදහසට;

(ඊ) එකලාව හෝ අන් අය හා සමග හෝ ස්වකීය සංස්කෘතිය භුක්ති විඳීමේ හා වැඩි දියුණු කිරීමේ නිදහසට සහ ස්වකීය භාෂාව භාවිත කිරීමේ නිදහසට;

(උ) එකලාව හෝ අන් අය හා සමග යම් නීත්‍යානුකූල රැකියාවක, වෘත්තියක, කර්මාන්තයක, වෙළඳ ව්‍යාපාරයක හෝ ව්‍යවසායක නියුක්ත වීමේ නිදහසට;

(ඌ) ශ්‍රී ලංකාව තුළ යාම් ඊම් නිදහසට සහ අභිමත ස්ථානයක වාසය කිරීමේ නිදහසට; සහ

(එ) ශ්‍රී ලංකාවට පෙරළා පැමිණීමේ නිදහසට හිමිකම ඇත්තේ ය.

# ජාත්‍යන්තර එකගතා හා දේශීය පනත්

- එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටක් ලෙස ශ්‍රී ලංකාව විවිධ ප්‍රඥප්තීන්ට එකඟව තිබේ
- ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් පිළිබඳ පනත (සිවිල් හා දේශපාලන/ ආර්ථික සමාජීය හා සංස්කෘතික) (Civil and political / Economic, Social and cultural)
- ජාත්‍යන්තර මානුෂවාදී නීතිය (Humanitarian Low )
- ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය (CRC)
- කාන්තා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය (CEDAW)

**දේශීය පනත් / ක්‍රියාත්මකවීම්**

- තේසවලාමේ
- මුස්ලිම් විවාහ නීතිය
- වකුබ් පනත
- විහාර දේවාලගම්
- උඩරට විවාහ
- කතිකාවත්

# සමාලෝචනය

- පුද්ගලයාගේ ස්වාධීන කැමැත්ත හෙවත් අභිලාශය ස්වච්ඡන්දතාව වේ. එහෙත් එය තීරණය කිරීම, ක්‍රියාත්මක කිරීම, හෝ අගය කිරීම විෂයෙහි ආගමික, සාමාජික හා නීතිමය විවිධ කාරණාවන් ඉදිරිපත් වේ
- ලංකාවට බුදුදහමේ පැමිණීම ආක්‍රමණයක් නොවන අතර එය සුහද පිළිගැනීමකි. ඒ අනුව මෙරට පැවති හෝ ආගන්තුව පැමිණි සියලු විශ්වාස ජන කණ්ඩායම් හා ආගම් ආදී සියල්ල සමාත්මතවය අගයා ඇත.
- එහෙත් රාජාණ්ඩු හා පෙරදිග භාරතීය ආභාසය ඇති ජන සංස්කෘතික කාරණා මත පුද්ගල ස්වචඡන්දතාව විෂයෙහි සීමා පැනවීම් පැවති බවත් යම් වැඩවසම් ලක්ෂණ ප්‍රකට කළ බවත් නොරහසකි.
- අධිරාජ්‍යවාදී ආක්‍රමණයන්හි ප්‍රවේශයම බලහත්කාරය, පීඩාව හා අමානුෂික වූවකි. එහිදී ඔවුන්ගේ අභිලාශ වෙනුවෙන් ගන්නා ලද ක්‍රියා මාර්ගයන්හි අතුරු ඵල ලෙස පැවැති ඇතැම් නිරර්ථක දෑ ප්‍රතික්ෂේපවීම හා ලෝක ප්‍රවණතාවට උචිත දෑ මගින් නීතිය පරිපාලනය හා දේශපානය වැනි දෑ සකස්වීම යහපත් ප්‍රතිඵල වේ

- ලොව සෑම රටකම ජන කණ්ඩායමකම ආගම සංස්කෘතිය හා දේශපාලනය අනුව පුද්ගල ස්වච්ඡන්ච්තාවට අදාළ නීතිමය සම්මුති හෝ භාවිතාව සිදුවේ. එහිදී ප්‍රධාන ජනවර්ගයාගේ හෝ කණ්ඩායමේ එකගතාවන්ට අනුව අනුකරණයවීමට අවකාශ සලසන රටවල් ද වේ. එහෙත් ශ්‍රී ලංකාව වර්තමානයේ ක්‍රියාත්මක කරන ව්‍යවස්ථාපිත නීතිය ජනවර්ගය හෝ ආගම විශේෂ කොට නොමැත.
- එහෙත් ජනවර්ග අනුව ක්‍රියාත්මක කරන අනපනත් මගින් පොදු සම්මුතියක් පිළිබඳව හෝ ජාත්‍යන්තර එකගතාවන්ට අදාළ සම්මුති පොදු ක්‍රියාකාරීත්වයක් දකින්නට නොමැත. එහෙයින් පුද්ගල ස්වච්ඡන්දතාව විෂයෙහි රටක් වශයෙන් ක්‍රියාත්මකවීම විමසා බැලිය යුතුය.

# මූලාශ්‍රය


- මහාවංශය 1, 2, 3, 4 හා 5 කාණ්ඩ, චන්ද්‍රාවික්‍රම ගමගේ සංස්, බෞ. සං. ම. දෙහිවල, 2015
- ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය, 1, 2 කාණ්ඩ, විද්‍යාලංකාර විශ්වවිද්‍යාල මුද්‍රණය 1977
- ලංකා බෞද්ධ සංස්කෘතිය, උණුවතුරබුබුලේ මහින්ද හිමි, ගොඩගේ සහ සහෝදරයෝ, 2018
- ශ්‍රී ලංකාවේ ඉතිහාසය 1, 2, 3 අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
- සංස්කෘතිය සමාජය හා පරිසරය, සරත් අමුණුගම, ගුණසේන සහ සමාගම, 1977
- මානව අයිතිවාසිකම් හා ශ්‍රී ලංකාවේ ආගම්, මානව අයිතිවාසිකම් පිලිබඳ විශ්ව ප්‍රකාශනයේ විවරණය, ශ්‍රී ලංකාවේ පදනම, 1991